## 2018 ජූලි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 ජූලි මස මාසික සභා රැස්වීම 2018.07.05 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්.සුමනාවතීමැතිතුමිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. සංවර්ධන නිලධාරී - එස්.එච්.එච්.එල්.ජයසූරිය මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්, පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

පසු ගිය සභා රැස්වීම් වාර්තාවේ 6.8 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අංක Iහි දැක්වෙන මාර්ගය රංවල රෝහල ඉදිරිපිට මාර්ගය වශයෙන් වාර්තාගතව ඇතත් එම මාර්ගයේ නම "පහලගම්මැද්ද සිට රංවල රෝහල දක්වා මාර්ගය"යනුවෙන් නිවැරදි විය යුතු බව එතුමා විසින් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් පසු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 2. ගරු සභාපති තුමාගේ නිවේදන

### I. පුහුණු වැඩමුළු පැවැත්වීම

සභා කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2018 ජූලි 12 වන දින පෙ.ව. 8.30 ට මෙනේරිපිටිය අධ්‍යාපන සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට නියමිත බව පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/3/4/1-2018V හා 2018.06.29 දිනැති ලිපිය මගින් දන්වා ඇති බවත්,එම අවස්ථාවට සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාට සහභාගී වන ලෙසත් ඒ සඳහා ගමනා ගමන පහසුකම් සපයන බවත්, ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

### II. වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද යථෝක්ත වාර්තාව අනුව විගණකාධිපති විසින් මෙම සභාවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවේ 2.1 හි තත්වාගණනය කල මතය ගරු සභාපතිතුමා විසින් සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

"2017 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු වන බව මා දරන්නා වූ මතය වේ."

## 3. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසු ගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමු කර ඇති බවත්, වීථි පහන් නඩත්තු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලදී.

## 4. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 4.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සිරිපාල මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.අසිත ප්‍රසාද් මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින් ඔවුන් දෙදෙනාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමිත් විජේරත්න මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු උප සභාපති සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 5. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 6. කල් දී ඇති යෝජනා

## 6.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. කහකොරටුව ගමට පානීය ජලය ලබා ගැනීම සඳහා අඟල් 1 ජලනල 100 ක් හා ලීටර් 500 ටැංකියක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

II. අළුතින් සවිකිරීමට වීථි පහන් 100 ක් හා වීථි පහන් 100ක් අළුත්වැඩියාවට අවශ්‍ය උපාංග ලබා ගැනීම අවශ්‍ය බවත්

III. ඕපනායක වල්ලකැටිය මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන සඳහා ගල්පස් කියුබ් 10ක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

IV. ප්‍රාදේශීය සභා මාර්ග වලට අවශ්‍ය හියුම් පයිප්ප සඳහා රුපියල් ලක්ෂ 5ක මුදලක් වෙන් කර දීම සුදුසු බවත්,

V. පැළැන්දකන්ද මාර්ගයේ වංගු සහිත ස්ථාන 4ක් පළල් කිරීම අවශ්‍ය බවත්,

VI. පැළැන්දකන්ද ජල යෝජනා ක්‍රමයට ලීටර් 10,000 ක ටැංකියක් ලබා දීම සුදුසු බවත්,

VII. සෞඛ්‍ය අංශ වල කැළිකසළ බැහැර කිරීම සඳහා නව වැඩපිළිවෙලක් හඳුන්වා දීම අවශ්‍ය බවත්,

VIII. ග්‍රාමීය ප්‍රජාව සඳහා පොත් ජංගම සේවාවක් පැවැත්වීම සුදුසු බවත්,

IX. කාර්යාලීයගබඩා අංශය සඳහා පරිගණක වැඩසටහනක් ලබා ගැනීම සහ ගබඩාව නවීකරණය කිරීම අවශ්‍ය බවත්,

X. කට්ටිකර අවසන් වූ බිම් කොටස් සඳහා ප්‍රාදේශීය සභාව මඟින් බිම් සැළසුම් අනුමත කිරීමේ දී සහනයක් සැලසීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ඉහත ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා සිය යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් පළකරමින්,පැළැන්දකන්ද මාර්ගයේ බස් රථයක් ධාවනය කරවීමට අවශ්‍ය අනුමැතිය පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ලබා දී ඇති බවත්, ඒ අනුව බස් රථයක් ධාවනයේ යෙදවීමට පෙර එම මාර්ගයේ වංගු සහිත පටු ස්ථාන පළල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති බවත්,ප්‍රකාශ කරමින් එම කාර්යය ඉටු කරවීමට සහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.තවද පැළැන්දකන්ද ජල ව්‍යපෘතිය වැඩිදියුණු කිරීම සඳහා ලීටර් 10000 ජල ටැංකියක අවශ්‍යතාවයද පැහැදිලි කල අතර කසළ එකතු කිරීමේ දෛනික කටයුතු සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳවද පහත සඳහන් කරුණු අනාවරණය කළේය.

මෙම සභා බල ප්‍රදේශයේ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල මෙන්ම වැලිගෙපොල නගරය තුල එකතුවන කසල එකතු කිරීම සභාව මඟින් සිදුවන අතර මෙම කාර්ය ඉටුකිරීමේදි සෞඛ්‍ය අංශය සඳහා සේවකයින් ප්‍රමාණවත් නොවීමත්,සිටින සේවකයින් සම්බන්ධයෙන් පවතින ගැටළු නිසාත්,දෛනිකව කසල ඉවත් කිරීමේ සේවාව විධිමත්ව පවත්වාගෙන යාමට නොහැකි තත්වයක් ඇතිබවත්,එවන් අවස්ථාවල සභාව යම්යම් අපහසුතාවන්ට ලක්වන බවත් පෙන්වා දුන් ගරු සභාපතිතුමා ,කසල ඉවත් කිරීමේ සේවාව විධිමත් කිරීම සඳහා සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගැනීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අංක X සම්බන්ධයෙන්ද සභාවේ සාකච්ඡාව සඳහා කරුණු පැහැදිලි කළ ගරු සභාපතිතුමා ,බිම්කට්ටි සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලියේදී සභාව විසින් ගනු ලබන තීරණයන්ට යටත්ව කටයුතු කිරීමට යාමේදී සභාවේ අනුමැතියෙන් තොරව අන්‍යාකාරයෙන් කට්ටි කර විකුණන ලද බිම් කොටසක් සඳහා බිම් කට්ටි සැලසුම අනුමත කිරීමට සභාවට නීත්‍යානුකූල හැකියාවක් නොමැති බවත්,එවන් අවස්ථාවක සභාව ගනු ලබන තීරණයන් මත අයදුම්කරුවන් අපහසුතාවට ලක්වන අවස්ථා ඇති බවත් අවධාරණය කළේය.කෙසේ වුවද මෑතකදී කට්ටි කරන ඉඩම් සම්බන්ධයෙන් සභාව විමසිල්ලෙන් කටයුතු කරන අතර ,වසර ගණනාවකට පෙර විකුණන ලද ඉඩම් සම්බන්ධයෙන් සාධාරණයක් කිරීම සුදුසු බව යෝජනා කළේය.අම්බැවිල ප්‍රද්ශයේ එවැනි ඉඩම් කොටසක් පවතින බවද එය 1989 වර්ෂයේදී කට්ටිකරන ලද එකක් බවද ගරු සභාපතිතුමා වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශකර සිටියේය.

මෙම කරුණ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ 1987 වර්ෂයේදී ප්‍රාදේශීය සභා පනත බිහි වීමත් සමඟ එම පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරිමට සභාව බැඳී සිටින බවයි.ඒ අනුව 1987 වර්ෂයට පසුව කෙරෙන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සහනයක් ලබා නොදිය යුතු බවත්, පෙන්වා දුන්නේය.

මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා සභාව අමතමින් ප්‍රකාශ කර සිටියේ අසාධාරණයට පත්වන ගැණුම්කරුවන් සම්බන්ධයෙන් සහනයක් ලබා දියයුතු බවයි.ඒ අනුව අවසානයේ වැඩිදෙනාගේ කැමැත්ත පරිදි නිවාස ණය ලබා ගැනීමේදී ගැණුම්කරුවන් පත්වන අපහසුතාවය සලකා 2000 වර්ෂයට පෙර කට්ටිකර විකුණන බිම් කොටස් සඳහා බිම්කට්ටි සැලසුම බල නොපාන අයුරින් කටයුතු කිරීමට සභාවේ එකඟතාවය හිමිවිය.
ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ජල ව්‍යාපෘති දීර්ඝ කිරීම් සම්බන්ධ යෝජනාවලට අදාලව කරුණු දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා සඳහන් කළේ ප්‍රදේශයේ පවතින ප්‍රජා ජල ව්‍යාපෘති බොහොමයක් අසාර්ථක තත්වයට පත්ව ඇත්තේ නිසි ක්‍රමවේදයක් නොමැති බැවින් ,සිලුම ජල ව්‍යපෘති සම්බන්ධයෙන් නියාමනයක් ඇතිකිරීම අනාගත යහපැවැත්මට හේතුවන බවටකරුණු අනාවරණය කළේය.එබැවින් ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් අරමුදල් යෙදවීමේදී ඒවා නියාමනය කිරීමත් සභාව සතු වගකීමක් බව එතුමා පෙන්වා දුන්නේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමියගේ පැමිණීම මෙම අවස්ථාවේදී සිදු විය.වේලාව පෙ.ව.10.45යි.

මේවන විට කිරඹ හිග්ගස්මණ්ඩිය ජල ව්‍යාපෘතිය අසාර්ථක වී ඇතිබවට සභාවේ කරුණු සාකච්ජා කරවීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඒකමතික අනුමැතිය පල විය.

එම යෝජනාවන්ට අමතරව ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනා ලෙස පහත සඳහන් යෝජනා සභා ගත කරන ලදී.

XI. ඕපනායක මහජන පුස්තකාලයේ අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලැයිස්තුවට සභා අනුමැතිය ලබා දෙන මෙන් යෝජනා කළේය.

**පුස්තකාලය අළුත්වැඩියා කිරීම සඳහා ද්‍රව්‍ය ඇස්තමේන්තු සකස් කිරීම**

| අනු අංකය | විස්තරය | ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1.0 | ඇතුළත බිත්ති වල තීන්ත ආලේප කිරීම | නිල් පාට | 4L |
| | | තැඹිලි පාට | 8L |
| | | කොළ පාට | 4L |
| 2.0 | පිටත බිත්ති වල තීන්ත ආලේප කිරීම | තැඹිලි පාට | 8L |
| 3.0 | දොර ජනෙල් වල තීන්ත ආලේප කිරීම | සුදු පාටතීන්ත | 4L |
| | | තිනර් | 3L |
| 4.0 | කාපට් ඇතිරීම | දුඹුරු පාටකාපට් | 21m |

| | | | |
|---|---|---|---|
| 5.0 | බිත්ති කැඩී බිඳී ගිය තැන් අළුත් වැඩියා කිරීම | පුටි | 4L |
| | | වැලි කඩදාසි 120 | 10 no |

XII. කොම්පෝස්ට් පොහොර නිශ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම්හ කිරීම සඳහා කහවත්ත වැවිළි සමාගම විසින් හුණුවල වතුයායේ ක්ෂේත්‍ර අංක 89,90,කොටසෙන් අක්කර 2 රූඩ් 38.8 ක් වූ ඉඩම නිදහස් කර ගැනීම සඳහා එකඟතාවය ලබා දී ඇති අතර එය නිදහස් කර ගැනීම සඳහා කහවත්ත වැවිලි සමාගමට රු.ලක්ෂ 5 ක් සභා අරමුදලින් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

XIII. මෙම සභාව සතු පහත සඳහන් ඉඩම් සංවර්ධනය කිරීමට අදහස් කර ඇති බැවින් ඒවායෙහි මැනුම් කටයුතු සිදුකර ගැනීමට සහා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කළේය.

1. කසල අංගනය ඉදිකිරීමට යෝජිත ඉඩම.
2. පෙළෙගෙවත්ත කඩ කාමර ඉදිකිරීමට යෝජිත ඉඩම.
3. වැලිගෙපොල සති පොළ භූමිය
4. ඕපනායක සති පොළ භූමිය.

XIV. රංවල පහලගම්මැද්ද මාර්ගය සභා අරමුදල් යොදා සංවර්ධනය කිරීමට කාර්මික නිලධාරී මහතා විසින් ඉදිරිපත් කරන ලද රු.123,000.00/= මුදල සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කළේය.

XV. නව ගම්මාන පාර කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමත්, සුදුසු බව යෝජනා කළේය.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

අනතුරුව සිය හදිසි යෝජනා සම්බන්ධයෙන් අදහස් පළ කළ ගරු සභාපතිතුමා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් නිදහස් කරවා ගැනීමට කහවත්ත වැවිළි සමාගම මගින් පාලනය වන හුණුවල වත්ත නො.05 කොටසේ ක්ෂේත්‍ර අංක 89 සහ 90 කොටසට අදාල තක්සේරු වාර්තාවක් ලබා දෙන ලද්දේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව බවත්,මෙම ඉඩමේ රබර් කිරි කැපීම සිදුවන අතර,තක්සේරු වාර්තාව අනුව ඉඩම් හිමිකරුට අහිමිවන ආදායම රු.1,684,700/=ක් බව සඳහන්ව ඇති බවත් ප්‍රකාශ කළේය.

මෙම සභාවේ ආදායම් තත්වය අනුව ඉහත මුදල ගෙවීම අපහසු වන බැවින් සහනදායි ගාස්තුවක් යටතේ ඉඩම නිදහස්කර දෙන ලෙසට සභාව මඟින් කරන ලද ඉල්ලීමට අනුව කහවත්ත වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් එවන ලද 2012.05.24 දිනැති ලිපිය මඟින් එම මුදල රු.1,265,000/=ක් ලෙස සංශෝධනය කර ඇති බවත් එම මුදල ගෙවීමටද සභාව අපොහොසත් වී ඇති නිසා මෑත කාලයේ උද්ගතවූ පාරිසරික ගැටළු හේතුවෙන් සහනදායි වැඩපිළිවෙලක් සඳහා සහය ලබා දෙන ලෙස නැවතත් වතු සමාගමින් කරන ලද ඉල්ලීම සලකා බලා රු 500,000/=ක් ගෙවා ඉඩම නිදහස් කර ගැනීමට එකඟතාව ලබා දී ඇති බවත්,සඳහන්කළේය.ඒ අනුව කසල

කළමනාකරණ වැඩ සටහනක් ආරම්භ කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය 2018.07.02 දින ක්ෂේත්‍ර පරීක්ෂණයකට පැමිණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සුදුසුම ඉඩම් කොටසක් ලෙස එම ඉඩම හඳුනාගැනීමෙන් පසුව ව්‍යාපෘතියේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට රු.මිලියන 250ක පමණ මුදලක් නිදහස් කිරීමට එකඟව ඇති බැවින් ඉහත මුදල වතු සමාගමට ගෙවීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය .

මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා අදහස් පල කරමින්,කහවත්ත වැවිළි සමාගම හා සබරගමුව මහ සමන් දේවාලය අතර ඉඩම් සම්න්ධයෙන් නඩු විභාගයක් පැවැත්වෙන බැවින් ,සභාවේ කටයුත්තක් සඳහා වතු සමාගමට අයත් ඉඩම් පවරා ගැනීමේ දී සපුරාගත යුතු නීතිමය අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කල යුතු බව පැහැදිළි කරමින් නඩු කටයුත්තක් යන අතර තුර ගණුදෙනුවක් සිදිවන්නේ නම් ඒ සඳහා පාර්ෂවකරුවන්ගේ එකඟතාවන් අධිකරණය හරහා ලබා ගත යුතුවන්නේ යැයි අදහස් පල කරන ලදී.

මෙම කාරණය සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිළි කළ ගරු සභාපතිතුමා යෝජිත ඉඩම නිදහස්කර ගැනීම සම්බන්ධයෙන් වතු සමාගමත්,සමන් දේවාලයත් එකඟතා ලිපි ලබා දී ඇති බැවින් ,ඉඩම් අත්පත් කර ගැනීමේ අතුරු විධාන මේ වන විටත් ඉඩම් අමාත්‍යාංශයට යොමුකිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට යොමුකර ඇති බැවින් ,ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති බව පෙන්වා දීමෙන් අනතුරුව ඒ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය පල විය.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාව සතු පෙළෙගෙවත්ත,වැලිගෙපොල සති පොළ සහ ඕපනායක සති පොළ භූමිය තුල ඇති තාවකාලික කඩ කාමර ඉවත් කර තිරසාර සංවර්ධනයකට යාමේ අවශ්‍යතාව පැහැදිලි කරමින් එම ඉඩම් කොටස් උපයෝගී කර ගනිමින් කඩ කාමර කිහිපයක් ඉදිකිරීමට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ දායකතවය ලබා ගැනීමට සභා අනුමැතිය ලබා දෙන ලෙසත්,සභා අරමුදල් යොදවා එම ඉඩම් කොටස් මැන පිඹුරුපත් සැකසීමට සභා අනුමැතිය ලබා දෙන ලෙසත් කරන ලද යෝජනාවට සභාවේ ඒකමතික අනුමැතිය ලැබිණ.

## 6.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා අද දින නිවාඩු ලබාගෙන ඇති බැවින් එතුමා විසින් න්‍යාය පත්‍රයට ඇතුලත් කර ඇති පහත සඳහන් යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රෝහණ විජේරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ස්ථිර කිරිමෙන් පසු එම යෝජනා සභා සම්මත විය.

I. කැබැල්ලකැටිය මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරිම සහ කෙසෙල්වත්ත මාර්ගයේ තැන්නහේන වත්ත දක්වා කාණු පද්ධතිය සකස් කිරිම.

II. හල්ලින්න හංදියේ සිට අම්බලන්මුල්ල දක්වා මාර්යේ දයානන්ද මහතා නිවස අසලින් පාර ගැලවී යන බැවින් එම ස්ථානයට පැති බැම්මක් සකස් කිරිම සහ අම්බලන්මුල්ල ගමට විකල්ප මාර්ගයක් කැපීම.

III. නො.06 වතු නිවාස වලට පිවිසෙන මාර්ගයේ පේරස් ඇළට බෝක්කුවක් ඉදි කිරිම සහ එම මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරිම.

## 6.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

ගරු මන්ත්‍රිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදි.

I. දඹගහවෙල මාර්ගයේ අබලන්ව පවතින බෝක්කුවේ පැති බැම්ම සකස් කිරිම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනිම
II. මැදගංඔය මාර්ගය දෙපස එළිපෙහෙලි කර කාණු පද්ධතිය සැකසීම.
III. අම්බැවිල මංසංන්ධියේ ඇති ඉඩම සභාවට පවරා ගැනිම සහ කඩ කාමර ඉදි කිරිමට ගෙන ඇති යෝජනාව කඩිනම් කිරිම
IV. තලගස්කන්ද මහෝමාර මාර්ගයේ කාණු පද්ධතිය සකසා ග්‍රෙවල් පස් දැමිම.
ඉහත යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජී.ජී.සිසිර ප්‍රෙමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා විසින් ඕපනායක සහ වැලිගෙපොල ඉඩම් මැන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් ගෙන ආ යෝජනා අතරට අම්බැවිල මංසංධියේ ඇති ඉඩමේ සභාවට අයිති කොටසද සංවර්ධනය කිරිමට අවධානය යොමු කරන ලෙසත්, මැදගංඔය මාර්ගයේ දෙපස එළි පෙහෙලි කරන ලෙසත්, ගරු මන්ත්‍රිතුමා ඉල්ලා සිටියේය.

බල ප්‍රදේශය පුරා ඇති සියලුම මාර්ග නඩත්තු කළ යුතු තත්වයේ ඇති බැවින් ඒවා පහසුවෙන් සංවර්ධනය කිරිමට යොදා ගත හැකි ග්‍රේඩරයක් අයගම ප්‍රදේශිය සභාවෙන් මෙම ප්‍රාදේශිය සභාවට මාරු කරවා ගැනිමට කටයුතු කර ඇති බව මෙම අවස්ථාවේදි සඳහන් කළ ගැරු සභාපතිතුමා එය ලබාදුන් පසු මාර්ග ගැටළු නිරාකරණය කර ගත හැකි බවත්, එම යන්ත්‍රය ක්‍රියා කරවිම සඳහා අයෙකු බඳවාගත යුතු බවත්, ප්‍රකාශ කළේය.

## 6.4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදි.

I. රම්බඩගොඩ දොලකන්ද සුසාන භූමියට පිවිසිම සඳහා පඩිපෙළක් සකසා ගැනිම අවශ්‍ය බවත්,
II. වල්ලකැටිය කොරටුවගොඩ මාර්ගයේ මඩවගුරු සහිත ස්ථාන ගල්පස් යොදා සකසා ගැනිම අවශ්‍ය බවත්,
III. ලියනගොඩ උඩගම ප්‍රද්ශයේ සතිපොළක් ආරම්භ කිරිම සුදුසු බවත්,
IV. අකරැල්ල වසම සඳහා සුසාන භූමියක් ලබා ගැනිම අවශ්‍ය බවත් යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදි යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එම්.වී.ශ්‍රිමාවති මැතිතුමිය විසින් ස්ථිර කළාය.

අනතුරුව සිය යෝජනා සම්බන්ධයෙන් අදහස් පළ කල ගරු මන්ත්‍රීතුමා රම්බඩගොඩ සුසානභූමියට පිවිසිම ඉතා අපහසු බැවින්, පඩිපෙළක් සකස් කර ගැනිම ඉතා අවශ්‍ය බවත්, මෙම කාර්යයේදි මරණාධාර සමිතිය හරහා ශ්‍රම දායකත්වය ලබා හැකි අතර ,අවශ්‍ය ද්‍රව්‍ය සභාවෙන් ලබා දෙන ලෙසටත් ඉල්ලා සිටියේය.අකරැල්ල වසම සඳහා සුසාන භූමියක් අකරැල්ල වත්තෙන් වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටි බැවින් ඒ සඳහා ඉල්ලිමක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් හා වතු සමාගමෙන් ඉල්ලා සිටිමටත්,ලිපියේ පිටපතක් අකරැල්ල සුබසාධක සංගමයට යොමු කිරිමටත්, තීරණය වු අතර එතුමා විසින් ඉදිරිපත් කළ යෝජනා සඳහා සභා අනුමැතිය ලැබිණ.

## 6.5. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රිමාවති මැතිතුමිය**

මෙම සභා බල ප්‍රදේශය මුල් කර ගෙන ඔසු උයනක් ආරම්භ කිරිම සුදුසු බව යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මනත්‍රිනි අචිනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් පල කරමින් තිරිසාර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමේ වැඩ පිළිවෙලක් සමඟ මෙම සභා බල ප්‍රදේශය තුල ඔසු උයනක් ආරම්භ කිරිමේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් සභා අනුමැතිය පල වු අතර,ඊට අවශ්‍ය ඔසු පැළ සභා අරමුදලින් ලබා ගැනිමට තිරණය විය.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ටී.සී.සිසිර කුමාර මැතිතුමා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරිම සඳහා එතුමා විසින් ගෙන යන රුක් රෝපණ වැඩ සටහන සභාවේ සහයෝගය ලබා දෙන ලෙසද එතුමා විසින් මෙම අවස්ථාවේදි ඉල්ලිමක් කළේය.

අකරැල්ල -උඩගම මාර්ගය සකස් කර ගැනිමට JCB යන්ත්‍රය ලබා දෙන ලෙසද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඒ.වී.ශ්‍රිමාවති මැතිතුමිය මෙම අවස්ථාවේදි ඉල්ලා සිටි බැවින් ,මාදොල උසාවිවත්තෙන් ක්‍රිඩා පිටියක් සඳහා මෙම සභාවට වෙන් කරන ලද කොටස සංවර්ධනය කිරිමෙන් හා හඳගිරිය විහාරස්ථානයේ කටයුතු අවසන් වීමෙන් පසුව ලබා දිමට තීරණය විය.

## **6.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය**

ගරු මන්ත්‍රීතුමිය විසින් හත්තැල්ල හෙළඋඩ ජල යෝජනා ක්‍රමයට විදුලිය ලබා දෙන ලෙසට එය සභාවටම පවරා ගෙන පවත්වාගෙන යන ලෙසටත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි සුමනාවති මැතිතුමිය විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව සභා සම්මත විය.

## **6.7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමානාවති මැතිතුමිය**

ගරු මන්ත්‍රිතුමිය විසින් තැන්නහේන පීල්ලවත්ත හා තලවත්ත ගම්වලට අයත් සුසාන භූමි මැන වෙන් කර දෙන ලෙසත් කන්දෙවිහාර හංදියේ සිට පීල්ලවත්ත දක්වාත්,කරගහයට සිට තැන්නහේන දක්වාත්,අක්‍රිය වී ඇති විථි පහන් අලුත්වැඩියා කර දෙන ලෙසත්,සභාගත කරන ලද යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කිරිමෙන් පසු සභා සම්මත විය.

## 6.7 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.ජී.ශාන්ත දෙල්හහකොට්ටුව මැතිතුමා

ගල්පාය පෙර පාසලේ ඉදිරි ක්‍රියාකාරිත්වය සම්බන්ධ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් වි නොමැති වුවත්,සභාවේ ඒකමතික තිරණය මත එම යෝජනාව සභාගත කිරිමට ගරු මන්ත්‍රිතුමාට එම අවස්ථාව සලසා දෙන ලදි.

ඒ අනුව මෙම සභාව මඟින් පාලනය වන මුත්තෙට්ටුපොල සුමඟ පෙර පාසලේ ප්‍රධාන ගුරුතුමිය විශ්‍රාම යන බැවින් දැනට සහය පාලිකාවක වශයෙන් කටයුතු කරන කාවින්දි නර්මදා රත්නායක මෙනවියට පෙර පාසල ඉදිරියට කරගෙන යාමට අවස්ථාව සළසා දිම සුදුසු බවට යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එන්.වී.ශ්‍රිමාවති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම කාරණය සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රිතුමා කාවින්දි නර්මදා රත්නායක මෙනවිය අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්,ගුරු දෙගුරු සබදතා හොදින් පවත්වාගෙන යන බවත් පවසන ලදි.දෙමව්පියන්ගේ ඉල්ලීම පරිදි ඇයට අවස්ථාව ලබා දෙන ලෙස එතුමා නැවතත් ඉල්ලා සිටියේය.

ඒ අනුව මෙම කරුණ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා අදහස් පළ කරමින් එම පෙර පාසලේ ඊට පෙර සහය පාලිකාව වශයෙන් කටයුතු කළ එන්.එම්.ලීලාවති මැණිකේ මිය වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරේ ස්ථිර කරනු ලැබුවේ පෙර පාසල් පාලිකා තනතුරක් නොතිබූ බැවින් බවත්,දෙමව්පියන්ට බරක් නොවන ආකාරයට පෙර පාසල පවත්වා ගෙන යා යුතු නිසා බවත්,දැනට ස්ථිර පෙර පාසල් පාලිකාවක සිටින නිසා ඇය වෙනත් කාර්යයක යෙදවූ බවත්, සදහන් කරමින් ඇයට අසාධාරණයක් නොවිය යුතු බවද පැවසුවේය.ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා අමතා උපදෙස් ලබා ගැනිමට තීරණය විය.

## 7. කාරක සභා වාර්තා සලකා බැලීම.

### 1.1. 2018.06.07 වන දින පැවති මුදල් හාප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 70-82 දක්වා වූ වියදම් සහ එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 1.1. 2018.06.25 වන දින පැවති මුදල් හාප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව කරනු ලැබූ තීරණ අංක 83-87 දක්වා වූ වියදම් සහ එදින කාරක සභාවට යොමු කරන ලද අංක 88-94 දක්වා වූ වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 8. ආදායම් වියදම් වාර්තා

## 8.1. 2018.මැයි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 664,285.51 | වැටුප් හා දීමනා | 2,471,721.21 |
| කුලී | 85,282.58 | ගමන් වියදම් | 11,983.60 |
| බලපත්‍ර ගාස්තු | 130,250.00 | සැපයුම් හා උපකරණ | 309,500.50 |
| සේවා සඳහා ගාස්තු | 100,172.00 | ප්‍රාග්ධන වත්කම් අළු.හා නඩත්තුව | 240,392.35 |
| වරෙන්තු ගාස්තු | 844,082.23 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 449,240.42 |
| වෙනත් ආදායම් | 22,634.53 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 1,893,749.12 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,740,455.97 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 15,737.59 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,498,575.67 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 16,500.00 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,740,455.97 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 95,833.41 | සේවක ණය | 260,000.00 |
| තැම්පත් | 27,740.00 | තැන්පත් | 153,248.98 |
| අත්තිකාරම් | 21,000.00 | ණයහිමි | 173,405.56 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 27,000.00 |
| වෙනත් ලැබීම් එකතුව | 2,066,043.61 | ජල ගබඩා | 15,496.87 |

| | | | |
|---|---|---|---|
| - | - | ගබඩා(ඖෂධ) | - |
| | | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | 443,349.75 |
| - | - | වෙනත් ගෙවීම් එකතුව | 1,072,501.16 |
| මුළු එකතුව | 5,951,072.99 | මුළු ගෙවීම් | 4,587,576.83 |

## 8.2. 2018 මැයි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31 ට හිඟ** | **2018** වර්ෂයේ ඇස්තමේන්තුගතආදායම | **2018.05.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **207605** | **4%** | **609563** | **31%** | **1330437** | 4495676 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5741** | **27%** | **15159** | 63036 |
| 3 | සැපයුම්කරුවන් ලියාපදිංචි නිරීම1.43 | | 125000 | | | **117175** | **94%** | **7825** | |
| 4 | ව්‍යාපාරබදු 2.16 | | 255000 | - | | **234000** | **92%** | **21000** | |
| 5 | වෙළෙඳබලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **741750** | **102 %** | **(11750)** | - |
| 6 | පරිසරබලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **4500** | **15%** | **25500** | |
| 7 | ලියාපදිංචිසහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **62559** | **14%** | **395441** | |
| 8 | ජලගාස්තු 4.14 | 1868941 | 6075000 | 1198677 | **64%** | **1397893** | **23%** | **4677107** | 670264 |
| 9 | විකුණුම් | | 497000 | | | **72238** | | | |
| 10 | යන්ත්‍රකුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **94350** | **9%** | **955650** | |
| 11 | වාහනනැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැගිලිබලපත්‍ර 3.43(4) | | 250000 | | | **12423** | **5%** | **237577** | |
| 13 | පොදුවෙළඳපලකුළී | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | මස්කඩමාළු කඩ කුලී 5.23(2) | 133193 | 428000 | 36561 | **27%** | **51800** | **12%** | **376200** | 96632 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **27561** | **25%** | **82439** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළගාස්තු5.23 (1) | 25880 | 254000 | 5000 | **19%** | **105490** | **42%** | **148510** | 20,880.00 |
| 18 | නිවාස කුලී | | | | | | | | |
| 19 | දැන්වීම්පුවරු ගාස්තු1.37 | | 400000 | | | **363000** | **91%** | **37000** | |
| 20 | ජලබවුසරය කුලියට දීම 4.25 | | 300000 | | | **61600** | **21%** | **238400** | |
| 21 | ක්‍රීඩාපිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවකණය පොලී1.64 | | **40000** | | | **19122** | **48%** | **20878** | |
| **25** | අයකරගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **2100** | **8%** | **22900** | |
| **26** | සභාවසතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150 %** | **(500)** | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31 ට හිඟ** | **2018 වර්ෂයේ ඇස්තමේන්තු ගතආදායම** | **2018.05.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය** | | **මෙමවර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල** | | **අයකිරිමටඇති ඉතිරිය** | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන් තුගත ආදායමෙන් | හිඟයන් |
| **27** | දඩ අනවසරඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අයකර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **404500** | **40%** | **595500** | |
| **29** | විශේෂසැපයුම් සදහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළභූමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්‍රීඩාපිටි ටකරන් මඩු කුලියටදීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **259266** | **30%** | **618874** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු එකතුව | **6791836** | **15179140** | **1471229** | **22%** | **4648432** | **31%** | **10105946** | **5346487** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12. 31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තු ගතආදායම | 2018.05.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙමවර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන් තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචිකිරීමේසහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම්හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පාපැදි බලපත්‍ර 1.35 | | 150 | | | - | 0% | 150 | |
| 4 | වරිපනම්සංශෝධන ගාස්තු | | | | | | | | |
| 6 | කසලඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 22,000 | 21% | 85000 | - |
| 7 | සභාභූමිය කුලියට දීම | | | | | | | | |
| 9 | නොපවරවාගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 29500 | 15% | 170500 | |
| 10 | පුස්තකාලසේවා ගාස්තු 6.43 | | 15000 | | | 1570 | 10% | 13430 | |
| 11 | පුස්තකාලදඩ 6.52 | | 20000 | | | 3359 | 17% | 16,641 | |
| 12 | ඉඩම්විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 172837 | 39% | 275553 | - |
| 14 | වෙළෙඳ ස්ථානකුලී03.22 | | 87600 | | | 30000 | 34% | 57,600 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100% | 259266 | 30% | 618874 | - |

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

උඩරංවල මාර්ගය සංවර්ධනය කිරීමට සභාව මැදිහත් වීම සම්බන්ධයෙන් සිය ස්තුතිය ප්‍රකාශ කර සිටි ගරු මන්ත්‍රිතුමා , එම කාර්යය ඉටු කිරීමේදී සිදු වූ බාධාවන් සම්බන්ධයෙන් පහත සදහන් කරුණු අනාවරණය කළේය.

දීර්ඝ කාලයක සිට මෙම මාර්ගය සංවර්ධනයකට ලක් නොවීම නිසා පාසල් ළමුන්, ප්‍රදේශවාසීන් නොයෙකුත් දුෂ්කරතාවන්ට ලක්ව සිටි බවත් ඒ නිසාම මෙම මාර්ගය සංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් තිබූ බැවින්, එතුමා පෞද්ගලිකව මැදිහත් වූ බව ප්‍රකාශ කළේය. ප්‍රදේශවාසීන්ගේ අත්‍යාවශ පොදු අවශ්‍යතාවක් ලෙස සද්භාවයෙන් යුතුව මෙම කාර්යය කරන අවස්ථාවේදී ගම තුළ කල්ලිවාදයක් ගොඩ නැගීම නිසා සංවර්ධන කටයුතු වලට බාධාවන් පැමිණි බවද ,එතුමා මෙහිදී විස්තර කළේය. එලෙස බාධාවන් මධ්‍යයේ වුවද එම මාර්ගයේ දුෂ්කරතා ඉවත් කර ගැනීමට කටයුතු කළද, අඩුපාඩු ඇති බැවින් නැවත එම ස්ථාන සකස් කර ගැනීමට JCB යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ ගරු මන්ත්‍රිතුමා කුමන බාධක මතු වුවද ප්‍රදේශයේ ජනතා වෙනුවෙන් එතුමා පෙනී සිටින බව තව දුරටත් පවසා සිටි අතර, එම මාර්ගය අම්බැවිල සිට රංවල දක්වාත්, මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එම මාර්ගය සංවර්ධනය කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස ගරු ආණ්ඩුකාර තුමියගෙන් පළාත් මාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලීමක් කරන ලෙස වැඩි දුරටත් ඉල්ලා සිටියේය.

තවද නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමේ වැඩ පිළිවෙල එක්සත් ජාතික පාක්ෂිකයින් විසින් දේශපාලනික මතිමතාන්දර මුල් කර ගනිමින් ක්‍රියාත්මක කරවීම නිසා එමගින් ප්‍රතිලාභ අපේක්ෂා කරන තවත් පිරිසකට අසාධාරණයක් සිදුව ඇති බවටද කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රිතුමා ‘ජනසවිය’ වැඩ සටහන මෙන් නොව මෙම වැඩ සටහනේදී දේශපාලනය තදබල ලෙස ඇදා ගනිමින් කටයුතු කිරීම පිළිබඳව දැඩි අප්‍රසාදය පළ කර සිටියේය.

එමෙන්ම එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රිනි විජයකලා මහේශ්වරන් ත්‍රස්තවාදය බල සම්පන්න කිරීමේ චේතනාවෙන් යම් යම් ප්‍රකාශයන් කිරීම තරයේ හෙලා දකිමින් ඒ පිළිබඳවත් දැඩි අප්‍රසාදය හා විරෝධය පළ කරන්නට යෙදිණි.

මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා නැගී සිටිමින් පසුගිය වසර 30ක කාලයක් තුළ උඩරංවල මාර්ගය සම්බන්ධයෙන් කිසිදු දේශපාලන පක්ෂයක මැදිහත් වීමක් සිදු නෙවූ බව සඳහන් කරමින් එම මාර්ගය සංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවය ප්‍රදේශයේ සියළුම දෙනාට එක සේ දැනෙන ප්‍රශ්නයක් වූ බැවින් පසුගිය දිනක සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාර තුමිය මුණ ගැසී ඒ පිළිබඳව දැනුම් දීමෙන් අනතුරුව ගරු ආණ්ඩුකාර තුමියගේත්, ප්‍රධාන ලේකම්තුමාගේත් උපදෙස් මත අදාල නිලධාරීන් ස්ථාන පරීක්ෂාවකට පැමිණි බවත් සඳහන් කළේය.තවද එම අවස්ථාවේදී උඩරංවල සිට කෝන්ගහවතුගොඩ දක්වා සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය මත එහි යථා තත්වය ඔවුන්ට පැහැදිළි කර දී ස්ථිරසාර විසඳුමක් ලබා ගැනීමේ අවශ්‍යතාවය මත කටයුතු කරමින් තම වගකීම ඉටු කිරීමට කටයුතු කලා විනා ගම තුළ කල්ලිවාදයක් ගොඩ නැගීමට උත්සාහයක් නොගත් බවද පැහැදිළි කළේය. අනතුරුව තව දුරටත් සභාව ඇමතූ ගරු මන්ත්‍රීතුමා විසින් විජයකලා මහේශ්වරන් මන්ත්‍රීතුමියගේ ප්‍රකාශයන් සම්බන්ධයෙන්ද විරෝධතාවය ප්‍රකාශ කළේය.

මෙම කරුණු කාරණා සම්බන්ධයෙන් සභාවේ උණුසුම් කථා බහක් ඇති වූ බැවින් ගරු සභාපති තුමා සභාව ආමන්ත්‍රණය කරමින් එකිනෙකා තුළ ගැටුම් ඇතිකර නොගන්නා ලෙසත් අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටි අතර ජාතික දේශපාලනය ඈදා ගනිමින් සභාවේ කටයුතු අඩාල කිරීමෙන් වැලකී න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා මූලාසනයට අවනතව සහයෝගය ලබා දෙන ලෙසද ඉල්ලා සිටියේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. දමිත් විජේරත්න මැතිතුමා මෙම අවස්ථාවේදී අදහස් පළ කළේය.උඩරංවල මාර්ගයසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අයිතිවාසිකම් කියා පෑමේදී හිටපු පළාත් සභා මන්ත්‍රී අජිත් කුමාර මැද්දේගම මැතිතුමා රංවල කෝන්ගහ මාර්ගයේ 1km සංවර්ධනය කිරීම අමතක කර ඇතිබව පැවසූ අතර , නිවාස ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන්ද පහත සඳහන් කරුණු අනාවරණය කළේය.එම වැඩසටහන එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන්ට පක්ෂග්‍රාහීව සිදු නොවූ එකක් බව තරයේ ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා රංවල කොට්ඨාශයට අදාල ලැයිස්තුව තුළ ඒ බව පෙනෙන්නට ඇති බවද ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රීමා මැතිතුමිය අදහස් දක්වමින් නිවාස ණය ලබා දීමේ වැඩ පිළිවෙල සඳහා ගොඩකවෙල බලවින්න **ප්‍රදේශ** වල අපේක්ෂකයින් වෙනුවෙන් පැවති සම්මුඛ පරීක්ෂණයට පක්ෂ භේදයකින් තොරව සහභාගී වී සිටි බවත් එහිදී එක්සත් ජාතික පාක්ෂිකයින්ට පමණක් අවස්ථාව ලබා දීමට කටයුතු නොකළ බවත් පැවසුවාය.තවත් අවස්ථාවක ඇය ඉහත සාකච්ඡාවට බඳුන් වූ කාරණා සම්බන්ධයෙන්ද අදහස් පල කරමින් සභාව තුල මතවාද ඇති කර ගැනීම අවශ්‍ය නොවන බවත්, විජයකලා මහේශ්වරන් මන්ත්‍රීවරියගේ ප්‍රකාශය සම්බන්ධයෙන් ඉහල දේශපාලන නායකයන් පිළිතුරු දී ඇති බවත් ප්‍රකාශ කළාය.

නිවාස ණය ලබා දීමේ පැඩ පිළිවෙලේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීම දේශපාලන බල අධිකාරියෙන් බැහැරව නිලධාරීන් හරහා සිදු වූවා නම් ගැටළු මතු නොවන්නට තිබූ බව සඳහන් කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් වසන්ත කුමාර මැතිතුමා ගල් කන්ද මාර්ගය ශුද්ධ පවිත්‍ර කර ගැනීමේ කටයුතුද කඩිනමින් සිදු කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

## 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමාද නිවාස වැඩ පිළිවෙලේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී දේශපාලනික පසුබිමක් නිර්මාණය කර ගැනීම අසාධාරණයක් බවත් ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිලධාරීන් හරහා සිදු විය යුතු කරුණක් බවත් පවසා සිටි අතර විජයකලා මහේශ්වරන් මන්ත්‍රීවරියගේ දුර්වල ප්‍රකාශය සම්බන්ධයෙන්ද අප්‍රසාදය පළ කරන්නට යෙදිනි. තවද බල ප්‍රදේශය තුළ යම් කාර්යයක් ඉටු කිරීමේදී එය බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ සිද්ධිය සහ උන්නතිය උදෙසාම සිදු විය යුතු අතරම, එය නිවැරදිව කළ යුතු අතරම, එය මහජන සුබ සිද්ධිය සඳහා ඉටු වන්නක් බැවින් එය සුභවාදීව දැකිය යුතු බවත් ප්‍රකාශ කළේය.ඉහත කරුණු සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව , ජී.එල්.ලාල් කුමාරරත්න යන මන්ත්‍රීවරුන්ද අදහස් දැක්වීය.

## 9.3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

මෙම අවස්ථාවේදී සභාව ඇමතූ ගරු මන්ත්‍රීතුමා අකරැල්ල, පරගහමඩිත්ත, ලියනගොඩ වසම් වල ප්‍රජා ජල ව්‍යාපෘති අසාර්ථක වී ඇති බැවින් එම ප්‍රදේශ වල ජල සම්පාදන ව්‍යාපෘතියක් ගෙන එන ලෙස ඉල්ලා සිටි බැවින් එම යෝජනාව රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට තීරණය විය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

වැලිගෙපොල වීරසේකර මුදලින්දාරාම විහාරස්ථානය මුල් කර ගෙන පවත්වන්නට යෙදුනු මිහිදු පෙහැර සඳහා සභා අර මුදලින් රු. 50,000/=ක් පරිත්‍යාග කිරිම සම්බන්ධයෙන් සිය ප්‍රණාමය පළ කරන්නට යෙදින.අනතුරුව ගරු මන්ත්‍රීතුමා විසින් වැලිගෙපොල පාසල් මාවතේ බර වාහන ගමන් කිරිමෙන් පාසල් ළමුන්ට බාධාවක් සිදු වන බව සැල කරමින් එම මාර්ගයේ රථ වාහන වල බර සහ වේගය පාලනය කිරිමට සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටින ලදි.

## 10. සභා රැස්වීමේ නිමාව.

ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා සභා රැස්වීමේ කටයුතු අවසන් කරමින් සභාව අමතා මෙම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය දිවෙන පළාත් මාර්ග බෙහෙවින්ම අබලන් වීම නිසා ගමනා ගමන අපහසුතා රැසක් මතුව ඇති බවත්,මේ සම්බන්ධයෙන් ජනතා අප්‍රසාදය මතුව ඇති බවත්,සඳහන් තරමින් මේ නිසාම උඩරංවල මාර්ගය සංවර්ධනය කිරිමට සභාවේ දායකත්වය ලබා දිමට ක්‍රියා කල බවත් සඳහන් කළේය.තවද, මෙම පාලන කාලය තුළ බල ප්‍රදේශයේ ජනතාවගේ සේවා අවශ්‍යතාවයන් උපරිම අයුරින් ඉටු කිරිමේ භාරධූර වගකිම සියලුම දෙනා වෙත පැවරි ඇති හෙයින් උප සභාපතිතුමා ඇතුළු අනෙකුත් ගරු මන්ත්‍රී මණ්ඩලයේ ගෞරවය ආරාක්ෂා වන අයුරින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාව පැහැදිළි කළේය.පළාත් මාර්ග ලේකම්තුමා පවසන ආකාරයට ඉදිරියේදි පළාත් මාර්ග සම්බන්ධව පවතින ගැටළු නිරාකරණය විය හැකි බවද වැඩි දුරටත් සඳහන් කල ගරු සභාපතිතුමා මෙම පළාත්

පාලන ආයතනයට අදාළ ග්‍රාම නිලධාරි වසම් 50ක් තුල ජීවත් වන ජනතාවට උපරිම සේවයක් ඉටු කිරිම තම අභිලාෂය බවත්,ඒ සඳහා පක්ෂ භේදයකින් තොරව මෙම ධුර කාලය තුළ අවශ්‍ය සහය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියේය.

එමෙන්ම පසුගිය රජය තුළ ජනතාවට යම් යම් ප්‍රතිලාභ හිමි කර දිමේදි දේශපාලන මතභේදයන්ගෙන් තොරව ලබා දුන් ආකාරයද සිහිපත් කළ ගරු සභාපතිතුමා ජනතාවගේ විදුලි අවශ්‍යතාවයන්ගෙන් 90% ක් විසඳුන බවත් ග්‍රාමීය මට්ටමින් ප්‍රතිලාභින් තෝරා ගැනිමේදි නිලධාරින්ට දේශපාලනික බලපෑම් වලින් තොරව කටයුතු කිරිමට ඉඩ කඩ ලබා දෙන්නේ නම් අදාළ නිර්ණායකයන් තුළ සුදුස්සන් තොරා ගැනිමේදි ගැටළු පැන නොනැගෙන බවත් අවධාරණය කළේය.තවදුරටත් සභාව ඇමතු සභාපතිතුමා දේශපාලනික ඉතිහාසය තුළ ලංකාවේ දිස්ත්‍රික් 24 න් රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් අඩුවෙන් ම කතා කරන දිස්ත්‍රික්කය රත්නපුර විම සතුටු විය හැකි බැවින් පළාත් පාලනයේ මෙහෙය වන ධුරධාරින් වශයෙන් මෙම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවතින ගැටළු නිරාකරණය කර ගැනිම සඳහා සියලුම දෙනා පක්ෂ භේදයෙන් තොරව එකතු වී වැඩ කිරිමට සහය දෙන ලෙස නැවතත් ඉල්ලා සිටිමින් රැස්විමේ කටයුතු ප.ව.1.30ට පමණ නිමාවට පත් කරන ලදි.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,<br>
සභාපති,<br>
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.